**වැලිගම ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂ එකතුව රු.418,443 ක් ද ලැබිය යුතු මුද්දර ගාස්තු රු.46,666,669 ක් හා ට්‍රේලරයක වටිනාකම රු.600,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි එකතුව රු.149,365 ක් වැඩියෙන් ප්‍රතිපාදන සලසා තිබුණු අතර ගෙවිය යුතු විවිධ වියදම් එකතුව රු.950,744 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගෙවා අවසන් කර තිබූ හා වැඩිපුර අයකර ගෙන තිබූ සේවක ණය රු.182,266 ක් ලැබිය යුතු සේවක ණය ලෙසද නිරවුල් කරන ලද රු.266,247 ක කර්මාන්ත අත්තිකාරම් ශේෂයක් ලැබිය යුතු ලෙස ද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛණ/උපලේඛණවල දැක්වෙන ශේෂ අතර රු.493,416 ක වෙනසක් පැවතුණි. | එකඟ වන බව. | අදාළ ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,093,509 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | |
| | රීති 211 | සූර්ය පැනල සහිත දීප්ත පහන් සවිකිරීම සඳහා මිලදීගත් රු.375,800 ක් වටිනා ජී.අයි. බට 23 ක් තොග ලේඛණයට ඇතුලත් කර නොතිබුණි. | එකඟ වන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය (1987 අංක 12 දරන පළාත් සභා පනතේ අනුෂාංගික විධිවිධාන පනතේ 2(1)(අ). | සභා අරමුදලින් වැය කර තිබූ අඩු ආදායම් ලාභී පුද්ගලයින් හට නිවාස ආධාර රු.10,060,000 ක්ද, සිප්දොර මාර්ගගත අධ්‍යාපන වැඩසටහන සඳහා රු.744,653 ක්ද යොමුගත රෙගුලාසි ප්‍රකාරව ලිඛිත පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතිය සඳහා යොමුකර ඇති බවත්, තවම අනුමැතිය ලැබී නොමැති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 104 (4) | 2019 සැප්තැම්බර් 27 දින අංක ZA-4971 රථය අනතුරට පත්වීමට අදාළ පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ.272(1) (2) | 2021 හා පසුගිය වර්ෂයේදී ගෙවීම් කරන ලද රු.937,248 ක් වටිනා වවුචර් 11ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ. 1642 | සභාව සතු වාහන සහ යන්ත්‍රෝපකරණ 5 ක් අනතුරට පත්වීම සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කර නොතිබුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.79,998,357 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.89,001,946 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 34,310,300 | 30,792,291 | 29,586,156 | 32,205,862 | 31,735,300 | 22,693,922 | 16,944,134 | 30,999,727 |
| කුලී | 4,480,000 | 3,760,982 | 3,229,068 | 2,241,836 | 6,370,000 | 2,896,359 | 3,483,791 | 1,709,922 |
| බලපත්‍ර ගාස්තු | 12,110,500 | 9,982,600 | 9,749,685 | 1,109,106 | 11,960,100 | 2,570,341 | 1,891,059 | 876,191 |
| වෙනත් ආදායම් | 34,177,100 | 19,123,762 | 19,687,111 | 3,589,354 | 30,918,100 | 135,864,078 | 136,205,521 | 4,152,703 |
| **එකතුව** | 85,077,900 | 63,659,635 | 62,252,020 | 39,146,158 | 80,983,500 | 164,024,700 | 158,524,505 | 37,738,543 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.30,046,506 ක් වූ අතර, ඒකක 22848 කට අදාළව බිල් කිරීම් රු.21,510,965 ක් සමඟ රු.51,557,471 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම රු.19,494,673 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.32,062,798 ක හිඟ ශේෂයක් පැවතුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | සභාව සතුව කුලී ගෙවන කඩ කාමර 57 ක් පැවති අතර ඉන් 37 කින් රු.1,315,331 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි. ඒ තුළ කඩ කාමර 04 ක් සඳහා රු.100,000 ට වැඩි හිඟයක් පැවතුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට බලපත්‍ර ගාස්තු හිඟය රු.876,191 ක් වූ අතර වර්ෂයේ බිල් කිරීම් රු.9,982,600 ක් සමඟ රු.10,858,791 ක් අයවීමට තිබුණි.වර්ෂය තුළ මුළු අයවීම් රු.9,749,685 ක් වීමෙන් වර්ෂය අවසානයට රු.1,109,106 ක හිඟයක් පැවතුණි. | 2024 අප්‍රේල් 30 වන විට හිඟ මුදලින් රු.932,656 ක් අයකර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ වෙනුවෙන් රු.5,366,648 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.141,606,267 ක් ලැබිය යුතුව තිබුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ආර්ථික නොවූ ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ප්‍රාදේශීය සභා කාර්යාල භූමියේ දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බිම සැකසීම සඳහා රු.1,049,844 ක වියදමක් දරා තිබූ අතර එම ඉදිකිරීම අතරමඟ අතහැර දමා භූගතව සිදු කර ඇති ඉදිකිරීම් වලට යාබදව සංවර්ධන බලපත්‍රයක් නොමැතිව එක්තරා සමාගමක් විසින් දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිරිස්ස ග්‍රාමීය රෝහල පිහිටි භූමියේ කොටස ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා අවිධිමත් ලෙස කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන රු.396,049 වැය කර තිබූ අතර සම්පූර්ණ භූමියම සන කැලෑවක් බවට පත්ව තිබූ බව ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී දක්නට ලැබුණි. | එකඟ වන බව. | සභාව සතු දේපල ඵලදායීව භාවිතයට ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනතා සේවය මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදීමට වෙබ් අඩවියක් නිර්මාණය සඳහා අවිධිමත් ලෙස තොරාගත් ආයතනයකට රු.162,500 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ නමුත් විගණන දිනය වූ 2024 මැයි 07 වන විටත් වෙබ් අඩවිය නිර්මාණය කර නොතිබූ අතර අවිධිමත් ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ද මේ දක්වා අවසන් කර නොතිබුණි. | පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති බවත්, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අනතුරට පත්වූ අංක PF-7423 දරන කැබ්රථය සඳහා මු.රෙ. 104 ප්‍රකාරව පරික්ෂණ සිදුකර අලාභහානි ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 104(4) පරීක්ෂණය සිදුකර අවසන් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සිට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 30 දක්වා කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීමේදී විවිධ කටයුතු වෙනුවෙන් රු.4,008,721 ක් වැය කර මිලදී ගැනීම හා විවිධ සේවා ලබාගැනීමේදී පිරිවිතර සකස් කර නොතිබීම, මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබීම, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම, භාණ්ඩ හා සේවා සැපයීමට ගිවිසුම්ගත නොවීම හා භාණ්ඩ හා සේවා වෙනුවෙන් ලබාගත යුතු සහතික ලබාගෙන නොතිබීම වැනි අඩුපාඩු දක්නට ලැබුණි. | ඉදිරියේ සිදුකරන ප්‍රසම්පාදන කටයුතු නිවැරදිව සිදුකරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂයේදී පූතික ටැංකි වලින් බැහැර කරන අපජලය පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ව්‍යාජ අයිතිකරු නමින් රු.16,800,000 කට ඉඩමක් මිලදී ගෙන තිබූ අතර ඒ සඳහා නීතිඥ හා මුද්දර ගාස්තු වශයෙන් රු.785,100 ක් සභා අරමුදලින් වැය කර තිබුණ ද ව්‍යාපෘතිය සඳහා ඉඩම ප්‍රමාණවත් නොවීමෙන් කිසිදු කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | පවත්නා භූමි ප්‍රමාණයෙහි පූතික අපජලය පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා තාක්ෂණිකව යෝග්‍ය බැව් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් තහවුරු කරන ලද බව. | සභා දේපල ඵලදායී ලෙස යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තල්අරඹ ස්ථානයේ සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව වර්ග මීටර් 69.76 ක පිහිනුම් තටාකය හා මීටර් 57.62 ක මායිම්ව නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව රු.98,570 ක ගාස්තු අයකර විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වෙන්දේසි කරන ලද ඉඩම් 49 කින් තක්සේරු විකුණුම් මිල මත සියයට 1 ක ගාස්තු වශයෙන් රු.25,114,874 ක් අයකර තිබුණද තක්සේරු හා සත්‍ය විකුණුම් වටිනාකම් අතර වෙනස මත අය විය යුතු සියයට 1 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී වෙනස අයකරගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------- | ----------- |
| (අ) | සභාව සතු වරකාපිටිය ආදාහනාගාරය සඳහා රථගාල පිහිටි ඉඩම රජයේ ඉඩම් ආඥාපනතේ 27 වගන්තිය අනුව සභාවට පැවරීමට අනුමැතිය ලැබී තිබියදී, සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තක්සේරු වාර්තාවක් ලබාගෙන තුන්වන පාර්ශවයක් වෙත රු.4,000,000 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | පැවරුම් නියෝගය ලැබී නොමැති බව. | අනුමැතිය පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේදී පොදු කටයුතු සඳහා සභාවට පවරන ලද අක්කර 01, රූඩ් 01, පර්චස් 2.80 ක් වූ කළුවර බැද්ද ඉඩම, හිටපු සභාපතිවරයෙකුගේ ඥාති සම්බන්ධතා ඇති සහ ඔහු විසින් 2012 දෙසැම්බර් 01 සිට 2013 නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් බදු ගෙන තිබූ කඹුරුගමුව බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගරාඩුව කඩලාන අක්කර 01 යි රූඩ් 2 ක් වූ පෞද්ගලික ඉඩමට හුවමාරු කරගෙන තිබූ අතර එම හුවමාරු කරන ලද කළුවර බැද්ද ඉඩම කැබලි කිරීම සඳහා ව්‍යාජ ලෙස අනුමැතිය ලබාදී නැවත එම ඉඩමෙන් අංක 4 හා 5 කොටස් පොදු කටයුතු සඳහා රු.3,850,000 ක් වැයකර සභාවට මිලදී ගෙන තිබුණි. | ඉඩමෙහි මැනුම් කටයුතු මෙතෙක් සිදුකර නොමැති බව. | පිරිවැය අවම වන ආකාරයට ඉඩම් මිලදී ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු 19 දිනෙන් සභිකයන්ගේ ධූර කාලය අවසන් වී තිබියදී සභිකයින් 40 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයට අදාළව සභික දීමනා රු.600,150 ක් ගෙවීම හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ මුදල රු.238,065ක් වූ අතර එම වැඩිපුර ගෙවා තිබූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ගෙවීම් කිරීමේදී නිවැරදිව කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පසුගිය වර්ෂයේ සභා අරමුදලින් ඉටු කරන ලද පොල්වත්ත, ගෙදරවත්ත මාර්ග සංවර්ධනය කිරීමට අදාළ බිල්පත තාක්ෂණ නිලධාරී විසින් සහතික කිරීමකින් තොරව මුදල් රෙගුලාසි 237(අ)(1) විධිවිධානවලින් බැහැරව රු.977,877 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව රු.1,800,000 කට පසුගිය වර්ෂයේදී මිලදී ගෙන තිබූ බවුසර් ටැංකිය කාන්දුවීම නිසා එම ආයතනයෙන්ම රු.3,200,000 ක මුදලකට පාවිච්චි කරන ලද තවත් බවුසර් ටැංකියක් මිලදී ගෙන මීට කලින් මිලදී ගත් ටැංකියට ගෙවන ලද හා තීන්ත ආලේපයට වැය වූ රු. 2,069,500 ක් අඩුකර රු.1,130,500 ක් ගෙවා තිබුණි. මෙම බවුසර් ටැංකිය ඉන්ධන පිරවීමට ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් අනුමැතිය ලබාගෙන නොතිබූ අතර වෙළඳපලේ පවතින මිල ගණන් අනුව Original ඉන්ධන බවුසර ටැංකියක් දළ ප්‍රවාහන වියදමද ඇතුලත්ව රු.2,270,855 කට මිලදී ගැනීමට හැකියාව තිබූ බවද නිරීක්ෂණය විය. | ආර්ථික අර්බුදය හා ඉන්ධන අර්බුදය හමුවේ මෙම මිලදී ගැනීම සිදුකළ බව. | රීති සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | පසුගිය වර්ෂයේ දී කඹුරුගමුව කසළ ව්‍යාපෘතියට යාබදව පිහිටි පිඹුරු අංක 35/215 දරන ඉඩමෙන් පර්චස් 100 ක් සභාවට මිලදී ගැනීමේදී තක්සේරු දෙපාර්තමේන්තුවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඉඩමේ වටිනාකම රු.9,400,000 කට තක්සේරු කරවාගෙන මිලදී ගැනීමට පෙර හිටපු සභාපතිවරයෙකුගේ නමින් තිබූ ඉහත ඉඩම තම දියණියගේ ස්වාමි පුරුෂයාට විකුණා ඔහුගෙන් රු.9,400,000 කට ඉඩම සභාවට මිලදී ගෙන තිබුණි. පසුගිය හා සමාලෝචිත වර්ෂයේදී ඉඩම මිලදී ගැනීම සඳහා මුද්දර ගාස්තු හා නීතිඥ ගාස්තු වෙනුවෙන් රු.424,000 ක් සභා අරමුදලින් දරා තිබුණි. | මෙම ඉඩමෙහි මැනුම් කටයුතු ආරම්භ කිරීමට නියමිත බවත්, වැට මායිම් යොදා කොම්පෝස්ට් අංගනයේ කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන බව. | පිරිවැය අවම වන ආකාරයට ඉඩම් මිලදී ගැනීම සිදුකළ යුතුය. |
| (උ) | අඩුපාඩු සහිත හා අනුමත නොකරන ලද ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව සංවර්ධන බලපත්‍ර ලිපිගොනු 58 ක් හා ඉඩම් අනුබෙදුම්වලට අදාළ ලිපිගොනු 134 ක් හිටපු සභාපතිවරයකු විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම වැලැක්වෙන පරිදි තම නිල කාමරයේ ගබඩා කරගෙන තිබූ අතර ලිපිගොනුවල ඇතුළත් ගොඩනැගිලි සැලසුම් පිටපත් 3 න් 1 ක් ගොනුවෙන් ඉවත් කර ව්‍යාජ මුද්‍රාව භාවිතා කරමින් ගොඩනැගිලි සැලසුම් අනුමත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | සභාව සැලසුම් කමිටුවට ඉදිරිපත් නොකළ හා අඩුපාඩු මත සැලසුම් කමිටුව විසින් අනුමත කර නොතිබූ ඉඩම් අනුබෙදුම් 3 ක් හා කැබලි සැලසුම් 3 ක් ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු විසින් සැලසුම් කමිටු තීරණ ඇතුලත් සැලසුම් අනුමත කිරීමේ නිල මුද්‍රාව වෙනුවට ව්‍යාජ මුද්‍රාවක් යොදා හා ව්‍යාජ සැලසුම් කමිටු තීරණ ඇතුලත් කර සාවද්‍ය ලෙස අනුමත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | ප්‍රාදේශීය හා නාගරික බලප්‍රදේශයේ විවිධ හේතු මත සැලසුම් කමිටුව විසින් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබූ ගොඩනැගිලි සැලසුම් 5 ක් හිටපු සභාපතිවරයකු විසින් සැලසුම් කමිටු තීරණ අංක රහිත ව්‍යාජ මුද්‍රාවක් යොදා අනුමත කර තිබූ බව ක්ෂේත්‍ර නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:4(i) විධිවිධාන වලින් බැහැරව 2021 වර්ෂයේ සිට 2023 අගෝස්තු දක්වා කාල සීමාව තුළ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 14 දෙනෙකු වෙත රු.63,931,823 ක ගිවිසුම්ගත වටිනාකමකට පවරන ලද කොන්ත්‍රාත් 37 කට සුරක්ෂණ ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක අත්තිකාරම් ලෙස රු.13,173,881 ක මුදලක් ගෙවා තිබුණි. | එකඟ වන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිරිස්ස ග්‍රාමීය රෝහල පිහිටි භූමියේ කොටසක ක්‍රීඩාපිටිය ඉදිකිරීමේදී මධ්‍යම මට්ටමේ පස් තුනී කර සනවත් කිරීමට නියමිත රේටය යොදා නොගැනීම නිසා රු.26,884 ක්ද තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව ගොනු කරන ලද පස් ප්‍රමාණය ඝන මීටර් 143.7 ක් වුවද ඝන මීටර් 204.75 කට ගෙවීම් කිරීම හේතුවෙන් රු.82,417 ක් වශයෙන් රු.109,301ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි. | එකඟ වන බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. |
| (ආ) | සභා බලප්‍රදේශයේ පානීය ජල සැපයුම නොමැති ප්‍රදේශ 9 ක ජල සැපයුම ලබාදීම සඳහා කාණු කැපීම වෙනුවෙන් JCB යන්ත්‍රයක් සඳහා කුලී වශයෙන් රු.891,318 ක් ගෙවීම් කර තිබූ අතර නියමිත රේටය භාවිතා නොකිරීම නිසා ඝන මීටරයට රු.375.55 බැගින් ඝන මීටර් 824.67 ක් වෙනුවෙන් රු.309,705 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | නිවැරදි රේටය භාවිතා කර ඇති බව. | නිවැරදි රේටයන් භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මත වරකපිටිය තල්ගහහේන අතුරු මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම වෙනුවෙන් රු.1,104,515 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ අතර වැඩ විෂය අංක 6 යටතේ පැති බැම්මේ Guard Stone 12 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.53,508 ක් ගෙවා තිබුණද 2023 ඔක්තෝබර් 27 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී Guard Stone ඉදිකර නොතිබුණි. | එකඟ වන බව. | ඉටුකළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඇ) | ජනහිත බේකරිය අසල කුදගල්හේන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,632,965 වැයකර තිබූ අතර මාර්ග තලය මට්ටම් කර නොතිබියදී රු.41,485 ක්ද, ABC නියමිත පරිදි ඇතිරීම සිදු නොකර රු.25,448 ක්ද, නියමිත ඝණකමට මාර්ග අදර (Curb) කොන්ක්‍රීට් නොකිරීම නිසා රු.23,902 ක්ද වශයෙන් රු.90,835 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | රඳවුම් මුදලින් අඩුකර ගෙවීම් සිදුකරන බව. | ඉටුකළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඉ) | දෙනිපිටිය නැගෙනහිර බුදුමැදුර අසල සිට මාර්ගය හා පැති බැම්ම සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.12,074,906 වැයකර තිබූ අතර පැතිබැම්ම හා ඉවුරුවලට සම්බන්ධ කර මාර්ග අදර ඉදිකර තිබූ ස්ථානවල හැඩයම් සකස් කිරීමට කොන්ත්‍රාත්කරුට රු.11,526 ක්ද, නියමිත ඝනකමට මාර්ග අදර (Curb) සකස් නොකිරීම හේතුවෙන් රු.28,680 ක්ද වශයෙන් රු.40,206 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | රඳවුම් මුදලින් අඩුකර ගෙවීම් සිදුකරන බව. | ඉටුකළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඊ) | පසුගිය වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මත ඉබ්බාවල කහඹිලියද්දුව මාර්ගය සංවර්ධනය කිරීමේදී වැඩ විෂය අංක 4 යටතේ ABC අතුරා තැලීම සඳහා රු.54,156 ක් ගෙවා තිබුණද නියැදි ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී ABC වෙනුවට ගල්කුඩු ඇතුරුමක් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු වෙත නොකළ වැඩ සඳහා රු.54,156 ක් ගෙවා තිබුණි. | රඳවුම් මුදලින් අඩුකර ගෙවීම් සිදුකරන බව. | ඉටුකළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු.1,335,806 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අය කරගැනීමට කටයුතු කරන බව. | අය නොවී පවතින ණය ශේෂ කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය. |